# මිල ගණන් කැඳවීම - 2023/2024

# කෘෂිකර්ම අමාත්‍යාංශය.

## තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය.

**තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය මගින් තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ නව ආපන ශාලාව 2023 නොවැම්බර් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා පවත්වාගෙන යාම සඳහා පුද්ගලයන්ගෙන් හා ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ.**

**විශේෂ කොන්දේසි**

- පුද්ගලයන්ගෙන් හා ආයතන වලින් මිල ගණන් කැඳවන අතර පදිංචිය සනාථ කිරිම සඳහා අදාළ ග්‍රාම නිලධාරි විසින් ඉදිරිපත් කරනු ලබන පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ඇති ඔබ සතු නිපුණතාව ඉදිරිපත් කළ යුතු අතර, ක්ෂේත්‍රය සම්බන්ධව ඇති නිපුණතාව ලංසු ඇගයීමේදී සලකා බලනු ලැබේ.

- ආර්ථික මධ්‍යස්ථාන ආපනශාලා පරිශ්‍රය හා ව්‍යාපාර තත්වයන් නිරීක්ෂණය කිරීමෙන් පසු මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව පසුව කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

- විදුලි බිල්පත් හා ජල බිල්පත් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. විදුලි බල්බ් හා ජල නළ උපාංග, අනෙකුත් හානියට පත්වන උපාංග සපයා සවි කර ගැනීම ටෙන්ඩර්කරු විසින් සිදු කළ යුතුය.

- රජයේ පාලන මිල සම්බන්ධයෙන් පවත්නා විධි විධාන ප්‍රකාරව ද, පාරිභෝගික ආරක්ෂක පනත යටතේ දැක්වෙන විධි විධානයන්ට අනුව හා කළමනාකරණ භාරය මගින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යන බවට පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.

- ඉදිරිපත් කළ හැකි අවම මාසික ලංසුව රු. 25,000.00 ක් වේ.

- මිල ගණන් ඉදිරිපත් කිරිම සඳහා ටෙන්ඩර් පෝරම ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයෙන් ලබා ගැනීම සඳහා රු.5,000.00ක ආපසු නොගෙවන මුදලක් හා රු. 50,000.00ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් ගෙවා අදාළ කුවිතාන්සිය ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

- ආහාර වර්ග සඳහා ටෙන්ඩරයෙහි ඉදිරිපත් කරනු ලබන මිල ගණන් යටතේම අදාළ ආහාර වර්ග ලබා දීම සිදු කළ යුතු අතර, ඒ බව පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

- ගිවිසුම් කාලය ටෙන්ඩරය ප්‍රදානය කරනු ලබන 2023 නොවැම්බර් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වේ.

- ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම 2023/10/09 වන දින සිට 2023/10/21 වන දින දක්වා කාර්යාල දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ කාර්යාලයේදී සිදු කරනු ලබයි.

- ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා ගෙවනු ලබන මුදල  හා ආපසු ගෙවන ලබන ඇප තැන්පත් මුදල ලංකා බැංකුව, තඹුත්තේගම ශාඛාවේ ඇති " තඹුත්තේගම විශේෂ ආර්ථික මධ්‍යස්ථාන භාර අරමුදල ගිණුම් අංක 72382324  දරණ ගිණුමට බැර කළ යුතුය.

- ඉහත පරිදි මුදල් ගෙවා ලබා ගනු ලබන තැන්පත් කුවිතාන්සිය ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයට ලබා දී මුදල් ගෙවූ බවට ලදුපත් ලබා ගත යුතුය. එසේ ලබා ගන්නා ආපසු ගෙවනු ලබන ඇප මුදල වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදුපත ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

- ටෙන්ඩර්පත් භාර ගැනීම 2023/10/23  වන දින ප.ව 02.00 ට අවසන් කරනු ලැබේ.

- ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් ප්‍රාදේශීය ලේකම් / ප්‍රසම්පාදන කමිටු සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තඹුත්තේගම යන ලිපිනයට 2023/10/23 දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. අතින් ගෙනවිත් භාරදෙන්නේනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසුව ඉදිරිපත් කරනු ලබන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ " ආර්ථික මධ්‍යස්ථානයේ නව ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම - 2023/2024" ලෙස පැහැදිලිව සඳහන් කර, කවරය  සීල් තබා ඉදිරිපත් කළ යුතුය.

- මෙම ප්‍රසම්පාදනයට අදාළව නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ලියකියවිලි සමඟ වන ප්‍රසම්පාදන කොන්දේසි සියල්ලටම යටත්ව හා එකඟව ඔබගේ මිල ගණන් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසුව එකී කොන්දේසි සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.
- අසම්පූර්ණ, ඉල්ලා ඇති ඇමුණුම් රහිත, විකෘති කරන ලද, වෙනස් කරන ලද හෝ මෙම ප්‍රසම්පාදනයට අදාළ කොන්දේසි වලට අනුකූල නොවන ටෙන්ඩරයක් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ බලය ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

- අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීම 2023/10/23 දින ප.ව 02.00 ට තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සිදු කරනු ලබන අතර ඉල්ලුම්කරුට හෝ බලයලත් නියෝජිතයකුට ඒ අවස්ථාවට සහභාගි විය හැක. බලයලත් නියෝජිතයෙක් සහභාගී කරවන්නේනම් ඒ සඳහා විධිමත් පරිදි බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මණ්ඩලය හා  තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයේ තීරණය අවසාන තීරණය වේ.

වැඩි විස්තර මධ්‍යස්ථාන කළමනාකරුගෙන් දු.අ. 025- 2275171 මගින් හෝ ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයට පැමිණ ලබා ගත හැක.

**අණ පරිදි,**
**සුමිත් .කේ. සෝමරත්න,**
**ප්‍රාදේශිය ලේකම් (තඹුත්තේගම) / ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය,**
**කළමනාකරණ කාර්යාලය,**
**තඹුත්තේගම.**
**2022/09/06**